**රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදල - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රේගු අතිකාල අරමුදලින් සියයට 10 ක වටිනාකමක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන අතර ඒ අනුව වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු අගය රු.7,052,811 ක් වුවද එය රු. 2,216,702ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ණයහිමියන්ගේ ශේෂය රු.4,836,109 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රේගු අතිකාල ගිණුමට වාර්ෂිකව ලැබෙන ලැබීම් වලින් 10%ක් රජයේ ආදායමට බැර කරනු ලැබේ. | ඒකාබද්ධ අරමුදලට බැර කරන වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු බව. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)අතිකාල ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සමඟ ඇස්තමේන්තුගත අතිකාල පැය හා අනුයුක්ත කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ඇතිකරගත් එකඟතාවයන් ඇතුළත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | - | එකඟතාවයන් ඇතුළත් ගිවිසුම් | ගිණුම් අංශය විසින් අතිකාල ගෙවනු ලබන්නේ අදාළ අංශ ප්‍රධානියා විසින් අතිකාල සේවයේ යෙදුනු අතිකාල ගෙවීමට සුදුසු බවට නිර්දේශ කළ නිලධාරින්ට වන අතර ඒ පිළිබඳව වන | අදාල ආයතනයන් සමඟ විධිමත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තොරතුරු අදාල අංශ වෙතින් ලබා ගැනීමේ හැකියාව පවතී. | |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු අතිකාල හා නැව්බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. කෙසේවුවද, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු, බාහිර පරීක්ෂණ සඳහා සහභාගි වන නිලධාරීන් සංඛ්‍යාව සහ ඊට වැය වන කාලය ආදී ද පුරෝකතනය කිරීමට නොහැකි බවත් විවිධ අංශවල ගෙවීමට ඇති සමහර ගොනු මූල්‍ය අංශයට නොඑවා රඳවාගෙන ඇති බවත් විගණනයට දන්වා තිබුණු අතර ඒ හේතුවෙන් මෙම ගෙවියයුතු වටිනාකම්වල නිවැරදිතාවය තහවුරු නොවුණි. | 475,205,493 | නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු, බාහිර පරීක්ෂණ සඳහා සහභාගි වන නිලධාරීන් සංඛ්‍යාව සහ ඊට වැය වන කාලය පිළිබඳ තොරතුරු. | රේගු දෙපාර්තමේන්තුවේ නැව්බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා බාහිර පරීක්ෂණ සඳහා සහභාගීවන නිලධාරීන් සංඛ්‍යාව හා ඊට වැයවන කාලයන් තීරණය කරනු ලබන්නේ එම ක්ෂේත්‍රයේ රාජකාරී ඉටුකරනු ලබන රේගු අධ්‍යක්ෂවරුන් විසිනි. ඒ අනුව, ගෙවීම් ගොනු අදාල රේගු අධ්‍යක්ෂ විසින් සහතික කර ගෙවීම් සඳහා ඉදිරිපත් කරනු ලබයි. | ගෙවිය යුතු අතිකාල හා නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු පිළිබඳව විධිමත් ලේඛන පවත්වාගෙන යා යුතු බව. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු.68,682,571 ක් වූ අතර ඉන් වසර 4 කට වඩා පැරණි ණයගැති ශේෂය රු.260,180 ක් ද වසර 3 කට වඩා පැරණි ශේෂය රු.1,125,605 ක් ද,වසර 2 කට වඩා පැරණි ශේෂය රු.1,991,434 ක් ද වසරකට වඩා පැරණි ශේෂය රු.3,648,600 ක් ද විය. අයවිය යුතු මුළු ණයගැති ශේෂය තුළ රු. මිලියන 2 සිට රු. මිලියන 15 | ණයගැති ශේෂයන් ලබාගනු ලබන්නේ නැව් සමාගම් / නැව් නියෝජිත ආයතන තම කාර්යය සිදුකර ගැනීමට ප්‍රථමයෙන් ලබා දෙනු ලබන ඇස්තමේන්තු අගය මත වන අතර ගෙවීම් සිදු කිරීමේදී බොහෝවිට මෙම අගයන් වෙනස් වනු ඇත. | හිඟ ණය ගැති ශේෂ අයකර ගැනීමට විධිමත් පියවර ගත යුතු බව. |

දක්වා හිඟ හිටි ගුවන් සමාගම් 4 ක් ද, බන්දිත ගුදම් හා නැව් සමාගම් 6 ක් ද විය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවෙකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී , සමාලෝචිත වර්ෂය සඳහා රු 938,872,620ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි . මෙම ගෙවීම් සිදුකිරීමේදී සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව සේවයේ යෙදෙන බවට තහවුරු කිරීමට “අතිකාල සටහන් පත්‍ර” භාවිතා කර තිබුණු අතර, එහි අතිකාල සේවයේ යෙදුනු බවට සේවකයන් දින කිහිපයක් එකවර සටහන් කිරීම සහ දිනපතා ඉහළ නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් නොකිරීම ආදී අභ්‍යන්තර පාලන දුර්වලතා විය. තවද, සමාලෝචිත වර්ෂයේ ල් දක්වා වූ ජනවාරි සිට අප්‍රේ කාලපරිච්ඡේදයට අදාලව පරීක්ෂාවට ළක් කරන ලද අංශ හතරක සේවකයන් කිසිවෙක් නිවාඩු ලබාගත් බවට නිවාඩු ලේඛණවල සටහන් කර නොතිබුණි . | රේගු දෙපාර්තමේන්තුවේ සේවාවන්හි සුවිශේෂී තත්වය හේතුවෙන් සහ ලෝක රේගු සංවිධානයේ නිර්නායක වලට අනුව සේවා පහසුකම් සැපයීමට රේගුව බැඳී සිටින හෙයින් රාජකාරි කාලසීමාවකින් තොරව පැය 24 පුරාම සේවය ලබා දීමට රේගු නිලධාරීන්ට සිදුවී තිබේ.ඒ අනුව , ඇඟිලි සලකුණු යන්ත්‍ර න් ඇතිවන භාවිතයෙ අපහසුතා මඟහරවා ගනිමින් උක්ත සේවා විධිමත්ව පවත්වා ගැනීමට දැනට ක්‍රියාත්මකයාත්මක ක්‍රි අත්සන් ලේඛන මවේදයම තවදුරටත් ක්‍ර පවත්වාගෙන යාමට ක්ෂ ආයතන අධ්‍ය ජනරාල්වරයාගේ අනුමැතිය විමසන ලදී. | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරීන්ට අදාල පොදු චක්‍රලේඛනය අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ)2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ------------------ | | | |
| (i) 15(1)(2) (ඇ) ඡේදය | අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරිවන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට පියවර ගත යුතු වුවද, අතිකාල අරමුදල තුළ සමුච්චිත වූ රු.1,765,360,124 ක මුදලක් දීර්ඝ කාලයක සිට පැවතිය ද එපරිදි කටයුතු කර නොතිබුණි. | ගිණුමේ නාමික වශයෙන් පවතින සමුච්චිත මුදල අතිරික්ත මුදලක් ලෙස දක්වා තිබුන ද මෙම ශේෂය භෞතිකව දෙපාර්තමේන්තු ගිණුමෙහි නොපවතින අතර පවත්නා ක්‍රමවේදයට අනුව දැනටමත් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම (ඒකාබද්ධ අරමුදල) වෙත ප්‍රේශණය කර ඇත. කෙසේවුවද, සේවා කාලයෙන් පිටත වේලාවන් හිදී සපයනු ලබන සේවය සඳහා මෙම මුදල් විවිධ බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගන්නා මුදලින් සෑදුනු සමුච්චිත ශේෂයක් බැවින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නැත. | චක්‍රලේඛයට අනුකූල විය යුතු බව. |
| (ii) 15(3)(1) (ඇ) ඡේදය | මුදල් වර්ෂය අවසන් වී මාස ක්02ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද මූල්‍ය, 2023 කාශන පමණක්ප්‍ර විගණකාධිපති 29 මාර්තු .වෙත ඉදිරිපත් කර තිබුණි | අරමුදලකට අදාල මූලික අංග වන වෙනම බැංකු ගිණුමක් හා මුදල් පොතක්, ලෙජරයන් හා උප ලෙජරයන් පවත්වාගෙන යාමක් නොපවතින අතර අරමුදල් කලමණාකරනයට අදාල සෙසු කාර්යය මණ්ඩලයක් නොමැත. ඒ අනුව, මෙම ගිණුමට අදාල තොරතුරු රේගු දෙපාර්තමේන්තුවේ | චක්‍රලේඛයට අනුකූල විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | කාර්යසාධන වාර්තාවට ඇතුලත් කරන අතර මෙම ගිණුම සඳහා වෙනම කාර්යසාධන වාර්තාවක් සකස් නොකරයි. | |
| (iii)15(3)(2) ජේදය | අරමුදලේ ගිණුම් කටයුතු සඳහා වෙනමම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වෙනම ගිණුම් කට්ටල හා බැංකු ගිණුම් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව සිදුකල නොහැක. | චක්‍රලේඛයට අනුකූල විය යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 180,967,588 ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.176,966,439 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,001,149 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රැස්කල අතිකාල ආදායම් රු.38,105,354 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා අතිකාල ආදායම් ලෙස රු. 841,480,851 ක් රැස් කර තිබුණු අතර ඒකාබද්ධ අරමුදල සඳහා වූ දායකත්වය හා ණයගැතියන් සඳහා වෙන්කිරීම් ගැලපූ පසුව අරමුදලේ මුළු වියදම රු.938,780,650 ක් විය. අතීතයේ එකතු කළ අතිකාල ආදායම් වර්තමාන අතිකාල ගෙවීම් සඳහා යොදා ගැනීම නුසුදුසු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අතිකාල අරමුදලේ ඌණතාවය වූ රු.180,967,588 ක් පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුළ අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. මෙම ඌණතාවය ඇතිවීම කෙරෙහි 2018 ඔක්තෝබර් 01 දින සිට | රේගු දෙපාර්තමේන්තු අතිකාල කමිටුව මගින් රටතුල කලින් කලට පවතින ආර්ථික තත්ත්ව සහ රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූල වෙමින් අතිකාල රේටයන් ඉහළ දැමීමට හා ගෙවිය යුතු පාර්ශව ඇතුලත් කිරීමට නිර්දේශ ලබාදී ඇති අතර ඒ සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන ඇත. රේගු ආඥා පනත යටතේ 2007.10.26 අංක දිනැතිව නිකුත් කර ඇති 17/1520 දරන නියෝගය අනුව හා එහි සංශෝධන අනුවද රේගු අතිකාල ගෙවීම පිළිබඳ තීරණ ගැනීමේ | අරමුදලේ ලැබීම් ඉක්මවා ගෙවීම් කිරීම පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු බව සහ අතිකාල ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම සියයට 50 කින් වැඩිකිරීමට ගත් තීරණය හේතුවී තිබුණි. තවද, අතිකාල රේට ඉහල දැමීමට හා අතිකාල ගෙවිය යුතු නව පාර්ශවයන් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කමිටුවක් විසින් පමණක් ගත් අවිධිමත් තීරණය සඳහා නිශ්චිත වලංගු අනුමැතියක් මුදල් අමාත්‍යාංශයෙන් මෙතෙක් ලබාගෙන නොතිබුණි. | බලධාරියා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා බව සඳහන් කර ඇත. | |
| (ආ) | 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ආයතන 65 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු..220,418 ක මුදල සාමාන්‍ය ඉතුරුම් තැන්පත් ගිණුම්වල යෙදවීම තුළින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.13,062,659 ක පොළී මුදලක් උපයා තිබුණු අතර වසර අවසාන දිනට ආයෝජන ගිණුමේ මුලු වටිනාකම රු.13,283,077 ක් විය. කෙසේවුවද, මෙම ආයතනවල පැවැත්ම, තවදුරටත් සේවා සැපයීම, දෙපාර්තමේන්තුව සමග ඇති බැඳියාව ආදිය පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | මෙහි සඳහන් ආයතන 65 සමඟ වසර ගණනාවක් තුල ගනුදෙනු කිසිවක් වාර්තා නොවන බැවින් අදාල ගිණුම් වසා දමා ගිණුම් ශේෂය සමඟ පොලී ආදායම රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත නිදහස් කිරීමේ හැකියාව පිළිබඳව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් විමසන ලදී. ඒ සඳහා තැන්පත්කරුගේ කැමැත්ත හෝ දැනුවත්භාවය අවශ්‍ය බව බැංකුව විසින් දන්වා ඇත. | වර්තමානයේ දී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳව විමර්ෂණයක් සිදුකර නිසි ගිණුම් තැබීම සිදුකල යුතු බව. |
| (ඇ) | අරමුදලේ ඌණතාවය පසුගිය වර්ෂයට වඩා රු. 4,001,149 කින් වැඩි වී තිබුණු අතර ඌණතාවය පියවා ගැනීම සඳහා සමුච්චිත අරමුදල් යොදා ගැනීම මත 2018 වර්ෂයේ සිට සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහෙමින් පැවතුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රු.2,331,074,672 ක්ව පැවති සමුච්චිත අරමුදලේ ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 1,765,360,124ක් දක්වා අඩුවී තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි . | සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රේගුවේ නිලධාරීන් සඳහා නියම කර ඇති සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පිටස්තර වේලාවන්හිදී හෝ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවල එම නිලධාරීන් විසින් ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අයකරනු ලබන සියලුම මුදල් සහ ඕනෑම රේගු නිලධාරියෙකු ස්වකීය නියම කාර්යාලයේ හෝ සේවා නියුක්ත ස්ථානයෙහි හෝ හැර වෙනත් කිසියම් කාර්යාලයක හෝ ස්ථානයක රාජකාරියෙහි නිරතවීම වෙනුවෙන් එකතු කරන ගාස්තු හෝ අයකිරීම් අතිකාල ගිණුමට බැර කරනු ලබයි. ඒ අනුව රේගු නිලධාරීන් අතිකාල වැඩ නිරතවීම තුලින් ලබන මුදල් පාදක කරමින් අතිකාල ගෙවීම් සිදු කල යුතු වුවද, රේගු නිලධාරීන්ට අමතරව දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි මෙම අරමුදලින් අතිකාල ගෙවීම හේතුවෙන් එලෙස අතිකාල අරමුදල් ගිණුමේ ශේෂය ක්‍රම ක්‍රමයෙන් හීන වී තිබුණි. | රේගු ආඥා පනතේ ප්‍රතිපාදන අනුව රේගු කාර්යයන් ඉටු කිරීම සඳහා රේගු සේවයේ නිලධාරින්ට අමතරව වෙනත් නිලධාරීන් හා සේවකයන් ද සේවයේ යෙදවීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකියාව පවතී. ඒ අනුව රේගු දෙපාර්තමේන්තුව තුළ රේගු සේවයේ නිලධාරින් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධාරීන් හා ඒකාබද්ධ සේවයේ විවිධ නිලධාරින් සේවය කරනු ලබයි. 2007.10.26 දිනැති දරන අතිවිශේෂ 17/1520 කාරව රේගු ය ප්‍රගැසට් පත්‍ර දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අයකරන ගාස්තු හෝ අයකිරීම් අංශ කිහිපයක් එම ක මඟින් සිදු කළදටයුතු සිදු කිරිම සඳහා අනෙක් සියලුම අංශවලට ඒකාබද්ධව රාජකාරී මෙහෙයුම් කටයුතු සිදුකල යුතුවේ. එබැවින් එම සේවාවන් ඉටු කිරීමට දායක වන සියලුම නිලධාරීන් සඳහා අතිකාල ගෙවනු ලබයි . | අතිකාල ගෙවීම් හඳුනාගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කල යුතු බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට අයකරගන්නා ලද ආදායම අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.841,480,851 ක්, රු.228,163,550 ක් හා රු.14,976,000 ක් වී තිබුණි. එම කාර්යයන්ගේ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට අතිකාල ආදායමෙන් සියයට 111 ක් ලෙස රු.938,872,620 ක් ද, නැව්බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් | | |

| | | |
|---|---|---|
| ලෙස රු.114,081,775ක් ද හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක්ද ගෙවා තිබුණි. ඉහත ගෙවීම් ක්‍රියාවලිය තුල පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ)අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ජාත්‍යන්තර වෙළදාම් සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් රේගු දෙපාර්තමේන්තුව වෙත අතිකාල ආදායම් රැස්වෙන අතර ඒ සඳහා සම්බන්ධ වන සියලුම නිලධාරීන් සඳහා අතිකාල ගෙවනු ලබයි. දෙපාර්තමේන්තුව තුල අතිකාල ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට තීරණ ගැනීම සඳහා නිර්දේශ ලබා දීමට අතිකාල කමිටුවක් පත්කර ඇත. | වර්තමාන අතිකාල ගෙවීම් ක්‍රියාවලිය සමාලෝචනය කළ යුතු බව. |
| (ආ) වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.97,391,769 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව රැස් කළ අතිකාල ආදායම ඉක්මවූ වියදම රු.3,441,271 කින් ඉහළ ගොස් තිබුණි. | වරින් වර නිකුත් කරනු ලබන රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව හා 2007.10.26 දිනැති අංක 17/1520 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හා එහි සංශෝධන ප්‍රකාරව යාවත්කාලීන නොවූ ගාස්තු ප්‍රමාණයන් අයකිරිම හේතුවෙන් රැස්කල අතිකාල ආදායම අඩුවී ඇත. අරමුදල යටතේ ආදායම් සම්බන්ධයෙන් රැස්කිරීම නැවත සලකා බලා යාවත්කාලීන කිරිම සඳහා ගාස්තු අයකිරීම් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත ඉදිරියේදි ඉහත රේටයන් යාවත්කාලීන කරනු ලැබේ. | රැස්කළ අතිකාල ආදායම ඉක්මවා ගෙවීම් නොකල යුතු බව. |
| (ඇ) නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමේ ප්‍රවර්ථන වර්ෂයේ ආදායම රු.25,213,318 කින් අඩුවී තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 9.95 ක පහළ යෑමකි. | වරින් වර නිකුත් කරනු ලබන රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව හා 2007.10.26 දරන 17/1520 දිනැති යඅතිවිශේෂ ගැසට් පත්‍ර ප්‍රකාරව යාවත්කාලීන නොවූ ගාස්තු ප්‍රමාණයන් අයකිරිම හේතුවෙන් රැස්කල නැව්බඩු | ආදායම් ඉපයීම නිසි පරිදි කළමනාකරණය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | පරික්ෂණ ගාස්තු ගිණුමේ ආදායම අඩුවී ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් වෙත අතිකාල ගෙවීම ශ්‍රී ලංකා රේගු අතිකාල අරමුදල මඟින් මෙන්ම ශ්‍රී ලංකා රේගුවේ 247-1-1-1002 වැය ශීර්ෂය මඟින්ද සිදුකර තිබුණු අතර, ඇතැම් නිලධාරීන් සඳහා රේගු අතිකාල අරමුදල මඟින් මාසිකව පැය 600 ක උපරිමයකට යටත්ව අතිකාල ගෙවීම සිදුකරන තත්ත්වයක් තුල එකම නිලධාරියා වෙත අතිකාල අරමුදල මඟින් මෙන්ම ඒකාබද්ධ අරමුදලින්ද ගෙවීම් කිරීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය. | ඒකාබද්ධ අරමුදලින් 247 -1-1002 වැය ශීර්ෂ මඟින් ගෙවනු ලබන අතිකාල දීමනා 2023 වසරේ සිට අත්හිටුවා ඇත. තවද, උපරිම පැය 600 ක අතිකාල දීමනා හිමි නිලධාරීන්හට කිසිදු අයුරකින් ඒකාබද්ධ අරමුදලින් අතිකාල ගෙවීම් සිදු වී නොමැත. | එකම නිලධාරියා වෙත ක්‍රමවේද දෙකෙහිම අතිකාල ලබා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කල යුතු බව. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිකාල අරමුදලේ 2022 ආදායම ලෙස රු.1,111,915,500 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද උපයාගත් සත්‍ය ආදායම රු. 841,480,851ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායමේ රු. 270,434,649 ක අහිතකර විචලතාවයක් නිරීක්ෂණය විය. මෙය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක පිරිහීමකි. ඊට ප්‍රධාන හේතු වශයෙන් ‘‘කොළඹ’’ අනුශීර්ෂය යටතේ වූ ආදායම රු. 270,578,467 කින් අඩුවීම බලපා තිබුණි. ඒ අනුව අතිකාල අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු.723,950 ක අතිරික්ත ආදායමක් අපේක්ෂා කළද ප්‍රතිඵලය වී තිබුණේ රු.180,967,588 ක ඌනතාවයකි. | අතිකාල අරමුදලේ ආදායම ඇස්තමේන්තුගත කරනු ලබන්නේ එම අවස්ථාව වන විට පවතින ජාතික ප්‍රතිපත්ති හා නීති රාමුව තුලයි. නමුත් 2022 වසරේ රටතුල පැනනැගුණ ආර්ථික අර්බුදය හමුවේ ආනයනයන් සීමා කිරිම හේතුවෙන් ඇස්තමේන්තු ගත ආදායම අඩුවී ඇත. | අය වැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන මෙවලමක් වශයෙන් භාවිතා කළ යුතු බව. |